# ලංකාව, ඉන්දියාව හා බටහිරයෝ - II

මෙරට දෙමළ ජාතිවාදයේ තවත් සන්ධිස්ථානයක් වුයේ ඉන්දු ලංකා ගිවිසුම ය. එදා ඉන්දියාවට අවශ්‍ය වුයේ වරධරාජා පෙරුමාල් ඔස්සේ උතුරු හා නැගෙනහිර පළාත්වල ඉන්දීය ගැති පාලනයක් අටවා අනෙක් පළාත්වල හැකිනම් ගාමිණී දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් පාලනයක් පවත්වාගෙන යාම ය. ඉන්දු ලංකා ගිවිසුම ඔස්සේ උතුරු හා නැගෙනහිර පළාත් දෙමළ ජනයාගේ ඊනියා නිජභූමි ලෙස පිළිගැණිනි. ඒ පළාත් දෙක තාවකාලිකව යැයි කියමින් එක් කෙරිණි. ඒ සියල්ල දෙමළ ජාතිවාදයට ජයග්‍රහණ විය.

දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය ඉන්දු ලංකා ගිවිසුමට සමගාමීව ඉදිරිපත් කෙරිණි. ඒ සංශෝධනයෙන් රටේ ඒකීය භාවයට තර්ජනයක් නොවන්නේ යැයි ශ්‍රෙෂ්ඨාධිකරණය විසින් බහුතරයකගේ කැමැත්තෙන් තීරණය කෙරිණි. ඒ කෙසේ වෙතත් විනාශකාරී තර්ජනය එල්ල වුයේ ඉන්දු ලංකා ගිවිසුමෙනි. ඒ ගිවිසුම හරහා ඊනියා ඉන්දීය සාම සාධක හමුදාව පැමිණියේ ය. ඉන්දියාව ඒ වන විට කොටින්ට විරුද්ධව සිටියේ ය. එහෙත් ඒ බව ප්‍රසිද්ධියේ නොකීමට ඉන්දීය නායකයෝ වග බලාගත්හ.

කොටින්ගේ වෙල්ලාල විරෝධය හරහා පැමිණි හින්දු විරෝධය හා ඉන්දීය විරෝධයත් බටහිර යුදෙව් ක්‍රිස්තියානි සම්බන්ධයත් වටහා ගැනීමට කෞටිල්‍යගේ මුණුබුරු මිණිබිරියන්ට අපහසුතාවක් විණි යැයි සිතිය නො හැකි ය. එමෙන් ම ප්‍රභාකරන් ද ඉන්දියාව තමන්ට විරුද්ධ බව දැන සිටියේ ය. ඉන්දු ලංකා ගිවිසුම අත්සන් කිරීමට පෙර ප්‍රභාකරන් ඉන්දියාවට ගෙන්වා ඔහු ගිවිසුමට කැමති කරවා ගැනීමට ඉන්දියාව අසාර්ථක උත්සාහයක යෙදුනේ ය.

එහෙත් අප ගිය සතියේ සඳහන් කළ පරිදි සිංහලයන්ගෙන් බහුතරය ඉන්දු ලංකා ගිවිසුමට විරුද්ධ විය. අප කැමති වුවත් අකමැති වුවත් එයට නායකත්වය දුන්නේ ශ්‍රී ල නි පක්‍ෂය ය. ජ වි පෙ ඒ ඔස්සේ ශ්‍රී ල නි පක්‍ෂය ද කපා දමා බලයට පැමිණීමට උත්සාහයක් දැරී ය. ශ්‍රී ල නි පක්‍ෂය අභිබවා යෑමට උත්සාහ කළ ජ වි පෙ එමගින් සිය දිවි නසාගැනීමට තැත්කළ ද අනුනමයෙන් බේරිණි. එහෙත් අප රටේ ඉතිහාසයේ දරුණුතම භීෂණ යුගයක් ඇති කිරීම සම්බන්ධයෙන් එ ජා ප මෙන් ම ජ වි පෙ ද වගකිව යුතු ය.

එකල ජ වි පෙ අතින් යම් යම් සාධනීය ක්‍රියා සිදු වූ බව නිසැක ය. එහෙත් ඔවුන් අතින් නිෂේධනීය ක්‍රියා ද සිදු විය. අප විසින් ජ වි පෙ පිළිබඳ තීරණයක් ගනු ලැබිය යුත්තේ ඒ සියල්ල සලකා බැලීමෙන් පසුව පමණ ය. මාක්ස්වාදය විසින් නොමග යවනු ලැබුව ද ජ වි පෙ ක්‍රියාකාරීහු ද පනස්හයේ දරුවෝ වෙති. ඔවුන් ශ්‍රී ල නි පක්‍ෂයෙන් ඈත්වන්නේ නම් ඒ ඔවුන්ට ම විරුද්ධවීමකි. ශ්‍රී ල නි පක්‍ෂයෙන් ඈත්වූ විට ජ වි පෙරමුණට අවියෙන් තොර දේශපාලනයක් ඉතිරි නො වෙයි.

සිංහලත්වයේ සටන්පාඨ අවසානයේ දී අතට ගත්තේ ප්‍රේමදාස මහතා ය. ඊනියා ඉන්දීය සාම සාධක හමුදාවට ආපසුයෑමට සිදුවීම ඉන්දියාවට අපේ කලාපයේ අත්වූ පරාජයක් විය. ඉන්දියාව නිදහස දිනාගත් අවධියේ සිට ම උත්සාහ කරන්නේ කලාපයේ එක ම බලවතා වීමට ය. කුප්‍රසිද්ධ පනික්කාර් මුලධර්මයෙන් කියැවෙන්නේ ඉන්දියන් සාගරය යනු ඉන්දියාවේ සාගරය බව ය. අද සාක් කලාපය නමින් හැඳින්වෙන රටවල බටහිරයන් හෝ චීනය හෝ වෙනත් රටක් හෝ බලවත්වනු දැකීමට ඉන්දියාව අකමැති ය. මේ කලාපයේ ඉන්දියාව අත නොදමන රටක් නැත.

ඉන්දියාව යනු දේශපාලනඥයන්ට වඩා නිලධාරීන්ට හා ඔත්තුසේවයට බලය ඇති රටකි. බ්‍රාහ්මණ පුරෝහිත සම්ප්‍රදාය තවමත් එහි රැකී ඇත. එහෙත් මේ බ්‍රාහ්මණයන්ට ඇත්තේ වටහිර ආකල්ප ය. ඔවුන්ගේ බ්‍රාහ්මණකම පුරෝහිත සම්ප්‍රදාය රැකගැනීමට පමණක් සීමා වෙයි. අද ඉන්දියාවේ ලංකාවට ද වඩා බටහිරකරණයට ලක් වූ මධ්‍යම පන්තියක් වෙයි. ඉන්දියාව අද මුළුමනින් ම බටහිර ආර්ථික වර්ධන මාවතක ගමන් කරයි. ඉන්දියාවේ මධ්‍යම පන්තියේ සිතුම් පැතුම් තීරණය වන්නේ බටහිර නුතනත්ව ආකෘතියෙහි ය.

අපේ කලාපයේ දී බටහිරයන්ගේ ලෝක ආධිපත්‍යවාදය සමග ඉන්දියාවේ කලාපීය ආධිපත්‍යය ගැටෙයි. අද මේ ගැටුම උගුව ම ක්‍රියාත්මකවන්නේ ලංකාවෙහි ය. ඊනියා සාම සාධක හමුදාව ඉවත්කරගැනීමෙන් ඉන්දියාව තරමක්

පසුබැසීමෙන් පසුව බටහිරයෝ තම දෙමළ ජාතිවාදී ප්‍රතිපත්තිය නැවතත් කරට ගත්හ. අසූවේ දශකයෙහි අග සිට ම අප අත්දුටුවේ බටහිරයන් සිංහලත්වයට එරෙහිව ලංකාවේ දෙමළ ජාතිවාදය යොදාගැනීම උත්සන්න කිරීම පිළිබඳ කතාව ය. බටහිරයෝ තමන්ගෙන් යැපෙන රාජ්‍ය නොවන සංවිධාන ඉදිරියට ගැනීම, ජඩමාධ්‍යවේදීන්ට නාම පුවරුවලට පමණක් සීමා වූ විවිධ මාධ්‍ය සංවිධාන තම මුදලින් අටවාදීම, ඊනියා සිවිල් (සිවල්) සමාජ ඇතිකිරීම ආදිය පමණක් නොව සිංහලත්වයට විරුද්ධව ශ්‍රී ල නි පක්ෂය යොදාගැනීමට ද ක්‍රියා කළහ. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය බයිලා කතුවරුන් හරහා ලංකාවට ආනයනය කරනු ලැබුයේ ඒ අරමුණින් ය.

බණ්ඩාරනායක මහත්ම මහත්මීන්ගේ දරුවන් තිදෙනා පනස්හයේ දරුවන් නොවීම ඉතිහාසයේ සරදමක් විය හැකි ය. පසුගිය දා අභාවප්‍රාප්ත අනුර බණ්ඩාරනායක මහතාට වඩා ගැලපෙන පක්ෂය වූයේ එක්සත් ජාතික පක්ෂය ය. ඔහු ඕල්කට් බෞද්ධයන්ට සමාන්තරව එ ජා පාක්ෂික ශ්‍රී ලංකා කාරයෙක් විය. පුතා එලෙස වන විට දියණියෝ මාක්ස්වාදය කටගාගත් රෝස පාට සමාජවාදීහු වූහ. ඔවුන් දෙදෙනාම විවාහ වූයේ සිංහලත්වයට විරුද්ධවූවන් සමග ය. ඔවුන්ගේ ස්වාමිපුරුෂයෝ සිංහලත්වයට විරුද්ධව ශ්‍රී ල නි පක්ෂය යොදාගැනීමට උත්සාහ කළහ. ඊනියා ජනවේග කල්ලිය, මහජන පක්ෂය සිංහලත්වයට එරෙහි වූ ස්වාමිපුරුෂයන් අටවාගත් සංවිධාන විය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය තවත් දෝන කතිරිනාවක කරගැනීමට තරම් විමලධර්මසූරිය කෙනෙක් මේ වකවානුවේ ලංකාවේ පහළ නො වී ය. අද චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ ආශිර්වාදය ලබන මහජන පාර්ශ්වය යනු ජනවේග කල්ලියේ හා මහජන පක්ෂයේ තවත් පුනරුත්පත්තියක් පමණකි. ශ්‍රී ල නි පක්ෂයේ සිටි වෙස්මුහුණු කරුවන්ට හා කාරියන්ට අද කීමට ඇත්තේ බටහිර සරණං ගච්ඡාමි, එ ජා ප සරණං ගච්ඡාමි රනිල් සරණං ගච්ඡාමි යන්න පමණ ය.

අනූවේ දශකයේ චන්ද්‍රිකා පුනරාගමනයෙන් පසු බටහිරයන්ගේ ඇඟිලි ගැසීම් වැඩිවිය. ලියම් ෆොක්ස් හරහා එ ජා ප ශ්‍රී ල නි ප එක මතයකට ගෙන ඒමට උත්සාහ කෙරිණි. ෆොක්ස් නැවතත් ලංකාවට පැමින ඇත්තේ හොඳකට විය නො හැකි ය. රනිල් වික්‍රමසිංහ මහතා අගමැති වීමෙන් පසුව ඊනියා සටන් විරාම ගිවිසුම අත්සන් කෙරිණි. මෙහි දී ඉන්දියාවේ කාර්යභාරය ප්‍රසිද්ධ වූයේ නොබෝදා ය. නෝර්වේ නියෝජිතයන් ගිවිසුම කෙටුම්පත් කිරීමට පෙර කිහිප වතාවක් ම දිල්ලියට ගොස් ඉන්දීය නායකයන් මුණගැසී ඇත. ඒ වන විටත් ලංකාව සම්බන්ධයෙන් ඉන්දියාවට බටහිරට වඩා බලපෑමක් කිරීමට හැකිවිය. බටහිරයන්ට තම කැමැත්තෙන් පමණක් ලංකාව සම්බන්ධයෙන් එවකට කටයුතු කළ නොහැකි විය. බටහිරයන්ට ඉන්දියාවේ සහාය අත්‍යාවශ්‍ය විය. එහෙත් ඊනියා සටන්විරාම ගිවිසුමෙන් පසුව බටහිරයෝ ක්‍රමානුකූලව චන්ද්‍රිකා රනිල් නායකත්වය යටතේ තම බලය වැඩිකර ගත්හ. බටහිරයෝ ලංකාව සම්බන්ධයෙන් කොසෝවා වර්ගයේ විසඳුමක් ලබාදීමට අවශ්‍ය පසුබිම සකස් කිරීමට පටන්ගත්හ. බටහිර මානව අයිතිවාසිකම් කරුවෝ ලංකාවේ අයිතිකරුවන් මෙන් ක්‍රියාකිරීමට පටන්ගත්හ. සතිපතා ඔවුහු මෙහි පැමිණියහ. වාර්තා සකස් කළහ. ආබර් කෝළම මේ නාඩගමේ උච්චස්ථානය විය. මානව හිමිකම් රැකීමට ඊනියා එක්සත් ජාතීන්ගේ මැදිහත්වීමක් කොයි මොහොතේ හෝ සිදුවිය හැකිව තිබුණි. ඉන්දියාව බටහිරයන්ගේ බලය වැඩිවීම ගැන විමසිල්ලෙන් බලා සිටියේ ය. එහෙත් ඔවුන්ට ඍජුව කළහැකි දෙයක් නො වීය.

සර්වපාක්ෂික නියෝජිත කමිටුවේ පූර්ව වාර්තාවක් කඩිනමින් නිකුත්වූයේ මේ සන්දර්භයෙහි ය. ඉන්දියාව ඒ වාර්තාවෙහි එල්ලිණි. වාර්තාව ජනාධිපතිතුමාට භාර දී පැය කිහිපයක් ඇතුළත ඉන්දියාව ඒ පිළිගත්තේ ය. කොසෝවා විසඳුමක් ක්‍රියාත්මක කිරීමට බලා සිටි බටහිරයන්ට කට ඇරගෙන බලා සිටීමට සිදුවිය. එහෙත් ඔවුන් තම උත්සාහය අත්හැර දමා ඇත. පසුගිය දා ප්‍රභාකරන් දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුන්ට කොසෝවා විසඳුමක් බලාපොරොත්තුවන ලෙස කියා ඇත්තේ නිකමට නො වේ. ෆොක්ස් කොළඹට පැමිණ ඇත්තේ අරලියගහ මන්දිරය නැරඹීමට නො වෙයි. ඉන්දියාව හා බටහිර අතර පවතින බල අරගලය අපට වාසිදායක අයුරින් යොදාගැනීමට අප කටයුතු කළ යුතු ය. මේ අවස්ථාවේ බටහිර විවේචනය නොකර හුදු ඉන්දීය විරෝධී අරගලයක් නිර්මාණය කිරීමට උත්සාහ කිරීම බටහිරයන්ගේ අමන්දානන්දයට හේතුවනු ඇත. අප කිසිම බලවතකුගේ ඍජු හෝ වක්‍ර හෝ නියෝජිතයන් නොවිය යුතු ය. ඉන්දියාවේ මෙන් ම බටහිර ද ඒජන්තයෝ මෙරට එමට සිටිති. අපට ඔරුව පැදගෙන එගොඩවීමට ඇත්තේ මේ සියළු කිඹුලන් මැද ය. අප බුද්ධිමත් නොවුවහොත් කිඹුලන්ට ගොදුරුවීම අනිවාර්ය වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva